**රාජාංගනය ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 04 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 21 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට රාජාංගනය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 5 කණුව ප්‍රදේශයේ පිහිටි පුස්තකාලයට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් සහ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් එකතුව රු.132,603 ක්වූ පුස්තකාල පොත් 554 ක් ලැබී තිබුණු අතර,ඒවායේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවියයුතු රු.197,540 ක්වූ ණය ශේෂය ගෙවියයුතු මුදලක් ලෙස ශේෂ පත්‍රයේ දක්වා නොතිබුණි.

(ඇ) එකතුව රු.519,750 ක්වූ වත්කම් 04 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර යටතේ ඇතුළත් කර නොතිබුණි.

## 02. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.1,242,115 ක්වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ඌණතාවය රු.1,150,044 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 බදුකුලී

(අ) ප්‍රධාන තක්සේරුකරු විසින් 2015 අප්‍රේල් 20 දින සභාවේ කඩ කාමර සම්බන්ධයෙන් නව තක්සේරු අගයන් ඉදිරිපත් කර තිබුණද එකී තක්සේරු අගයන් මත කුලී අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියේ සඳහන් පරිදි සංවර්ධනය නොකළ ඉඩම්වල බිම් අගයෙන් සීයයට 02 ක් නොඉක්මවන බද්දක් වාර්ෂිකව ඉඩම් හිමියන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 1994 අගෝස්තු 14 දිනැති අංක එන්සීපී/එල්ජී/9/7/19(i) දරන චක්‍රලේඛය ප්‍රකාරව වසර 05 කට වරක්වත් කඩකුලී තක්සේරු කළයුතු වුවත් වසර 21 කට වඩා පැරණි තක්සේරු අගයන් පදනම්ව කඩකුලී අය කරමින් තිබුණි.

### 2.2.2 උසාවි දඩ

සමාලෝචිත වර්ෂය අවසාන දිනට අයවියයුතු රු.1,844,768 ක්වූ උසාවි දඩ ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 මුද්දර ගාස්තු

සමාලෝචිත වර්ෂය අවසන් දිනට 2013 වර්ෂය වෙනුවෙන් ගණනය කරන ලද රු.221,000 ක්වූ මුද්දර ගාස්තු ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සේවකයින් 13 දෙනෙකුගෙන් අයවියයුතු එකතුව රු.1,844,768 ක්වූ හිඟ ණය ශේෂය අයකර ගැනීමට සභාව විසින් දිර්ඝ කාලයක සිට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහනට අදාලව සමාලෝචිත වර්ෂය සඳහා අනුමත වී තිබුණු රු.3,000,000 ක්වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) පළාත් සභා විමධ්‍යගත වැඩ සටහන යටතේ මිලදී ගෙන තිබුණු රු.419,308 ක්වූ භාණ්ඩ 2016 මැයි 25 දින වන විටද අදාල ප්‍රතිලාභීන්ට ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) එකතුව රු.2,421,532 ක්වූ ගිණුම් විෂයයන් 04 කට අදාලව ලැබියයුතු ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) එකතුව රු.1,182,568 ක්වූ ගිණුම් විෂයයන් 04 කට අදාලව ගෙවියයුතු ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.2 නිශ්ක්‍රීය වත්කම්

------------------

රු.682,815 ක්වූ යන්ත්‍ර උපකරණ අයිතම් 04 ක් වර්ෂ ගණනාවක් තුල නිශ්ක්‍රීයව පැවතුණි.

## 04. පද්ධති හා පාලනය

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) සේවක ණය කළමනාකරණය